2016
04.25 අද

DEPARTMENT OF CENSUS & STATISTICS
LIBRARY
COLOMBO

# 2016 මාර්තු උද්ධමනයේ ඉහළ යෑමක්

## - 2016 මාර්තු මස ජාතික පාරිභෝගික මිල දර්ශකය 110.0 යි

**මහීෂා චන්ද්‍රගුප්ත**

2016 මාර්තු මාසය සඳහා වාර්ෂික උද්ධමනය 2.2%ක් ලෙස ගණනය කර ඇති අතර, පෙබරවාරි මාසයේ වාර්තා වූ 1.7% ක උද්ධමනය සමග සැසඳීමේදී මාර්තු මාසයේ උද්ධමනය ඉහළ යෑමක් පෙන්නුම් කර ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිවේදනය කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා මෙම කරුණු අනාවරණය කළේය.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2016 මාර්තු මස ජාතික පාරිභෝගික මිල දර්ශකය 110.0 ලෙස ගණනය කර ඇත. මාර්තු මාසයේ දර්ශකය පෙබරවාරි මාසයේ දර්ශකය (110.8) හා සංසන්දනය කළ විට 0.8ක දර්ශකාංක අඩුවීමක් හා ප්‍රතිශතයක් ලෙස 0.72ක අඩුවීමක් වාර්තා කර ඇත. මේ සඳහා ආහාර කාණ්ඩයේ වටිනාකමේ වෙනස 0.73% කින් අඩුවීම හා ආහාර නොවන කාණ්ඩයේ වටිනාකමේ වෙනස 0.07% කින් වැඩිවීම බලපා ඇති බවද එම දෙපාර්තමේන්තුව පවසයි.

2016 පෙබරවාරි මාසය හා සසඳන විට 2016 මාර්තු මාසය සඳහා ආහාර කාණ්ඩයේ වටිනාකමේ වෙනසෙහි 0.73% ක අඩුවීමක් දක්නට ඇත. මෙම අඩුවීම සඳහා එළවළු (0.47%), සහල් (0.39%), අමු මිරිස් (0.09%), පොල් (0.03%), රතු ලූනු (0.03%), කෙසෙල් (0.03%) සහ සියඹලා (0.02%) යන ආහාර ද්‍රව්‍යවල වටිනාකමේ වෙනසෙහි අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේ වුවත් ලොකු ළූණු (0.08%), වියළි හාල්මැස්සන් (0.03%), අලුත් මාළු (0.03%), පාන් (0.03%) සහ මිරිස් කුඩු (0.02%) යන ආහාර ද්‍රව්‍යවල වටිනාකමේ වෙනසෙහි වැඩිවීමක් වාර්තා වී ඇත.



2016 පෙබරවාරි මාසය හා සසඳන විට 2016 මාර්තු මාසය සඳහා ආහාර නොවන කාණ්ඩයේ වටිනාකමේ වෙනසෙහි 0.07% ක වැඩිවීමක් දක්නට ඇත. මෙම ආහාර නොවන කාණ්ඩයේ වටිනාකමේ වෙනස වැඩිවීම සඳහා 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' කාණ්ඩයේ වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. 'රෙදිපිළි හා පාවහන්', 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', 'ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'ආපනශාලා හා හෝටල්' සහ 'විවිධ භාණ්ඩ හා සේවා' යන කාණ්ඩවල ඉතා සුළු වෙනස්වීමක් වාර්තා වී ඇත. 'සෞඛ්‍ය', 'ප්‍රවාහන', 'සන්නිවේදන', 'විනෝදාත්මක හා සංස්කෘතික' සහ 'අධ්‍යාපන' කාණ්ඩවල වෙනස්වීමක් සිදුවී නොමැති බවද එම දෙපාර්තමේන්තුව පෙන්වා දෙයි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් නවතම පාරිභෝගික මිල දර්ශකය වන ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013=100) 2015 ඔක්තෝබර් මස සිට අදාළ ලිත් මාසය අවසන් වී 21 වැනි දින ප්‍රකාශයට පත් කරනු ලබයි.